**ශීර්ෂ 258- මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | ගඟවට කෝරළේ | (ඌ) | හතරලියද්ද | (ච) | යටිනුවර |
| (ආ) | පාතහේවාහැට | (එ) | පූජාපිටිය | (ජ) | උඩුනුවර |
| (ඇ) | දෙල්තොට | (ඒ) | තුම්පනේ | (ට) | හාරිස්පත්තුව |
| (ඈ) | උඩපළාත | (ඔ) | මිනිපේ | (ඩ) | අකුරණ |
| (ඉ) | උඩුදුම්බර | (ඕ) | කුණ්ඩසාලේ | (ණ) | මැදදුම්බර |
| (ඊ) | පාතදුම්බර | (ක) | දොළුව | (ත) | පස්බාගේ කෝරළේ |
| (උ) | පන්විල | (ග) | ගඟඉහළ කෝරළේ | | |

### 1.1 විගණන විෂය පථය

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජුනි 09 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්,

රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 926.57 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 923.38 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.මිලියන 3.19 ක් හෙවත් සියයට 0.3 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 823.47 | 820.38 | 3.09 | 0.38 |
| මූලධන | 103.10 | 103.00 | 0.10 | 0.10 |
| **එකතුව** | **926.57** | **923.38** | **3.19** | **0.34** |

#### (ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 30 ක් හා දෙපාර්තමේන්තු 21 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 5,075.61 ක් හා රු.මිලියන 2,029.89 ක් වශයෙන් රු.මිලියන 7,105.50 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් පිළිවෙලින් රු.මිලියන 4,702.00 ක් හා රු. මිලියන 1,829.61 ක් වශයෙන් රු.මිලියන 6,531.61 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.මිලියන 373.61 ක් හා රු.මිලියන 200.28 ක් වශයෙන් රු.මිලියන 573.89 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25801 | 70 | 69 | 51 | 58 | 240 | 202 |

## 2.3 අග්‍රිම ගිණුම

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 0.52 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 926 ක් විය.

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3.** **ශීර්ෂ 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-----------------------------------------------**

**3.1** **පොදු තැන්පත් ගිණුම**

**----------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.7,828,665 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-----------------------------------------------------------------**

විෂය අංක 25801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,977,969 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 06 සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 38 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.2,838,250ක් වූ ණයගැති ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.3, 4.2.5 සහ 4.4 සිට 4.6 දක්වා වගන්ති ප්‍රකාරව කටයුතු කර 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. මෙම ණය ශේෂ 2012 පෙබරවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදයට අයත් ණය ශේෂ විය.

(ඇ) ස්ථාන මාරුවී ගිය නිලධාරින් 9 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.847,563 ක ණය ශේෂයන් හා ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරින් 04 දෙනෙකු වෙනුවෙන් පියවිය යුතු රු.269,465ක ණය ශේෂය සම්බන්ධයෙන් 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර එම ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.3** **වත්කම් කළමනාකරණය**

**--------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

---

ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බඩු වට්ටෝරු ලේඛනය අනුව, 2009 වර්ෂයට පෙර මිලදී ගන්නා ලද පොජෙක්ටර් යන්ත්‍රයක් (3m overhead projector 1700 series) ප්‍රයෝජනයට ගැනීමකින් තොරව ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ එකකට අඩු බේරුම් නොකළ බැරකම් රු.45,430 ක ශේෂයක් පැවැතුණි.

**3.4 අනුකූල නොවීම්**

---

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සංවර්ධන නිලධාරීන් 56 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම නිලධාරීන් ග්‍රාම සේවා වසම් 56 ක ක්ෂේත්‍ර නිලධාරීන් වශයෙන් යොදවා ගෙන රු.17,058,096 ක පාරිශ්‍රමික ගෙවා තිබුණි. අංක HAF/01/9/ දරන විවිධ දිස්ත්‍රික් පාලන අංශයේ චක්‍රලේඛයට පටහැනිව 2014 නොවැම්බර් මාසය වන විට එම නිලධාරීන් විසින් ඉදිරි වැඩසටහන් පිළියෙල කර අනුමත කරවා ගෙන නොතිබුණු අතර, ලිපිගොණුද යාවත්කාලීන කර නොතිබුණි.

**3.5 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 ක ක්‍රියාත්මක කිරිමට සැලැසුම් කර තිබුණු එකතුව රු.141,848,944 කට ඇස්තමේන්තු කළ ව්‍යාපෘති 244 ක් ආරම්භ නොකර අතහැර දමා තිබුණි.

**(ආ) ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම්**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක එකතුව රු.52,104,251 ක් වූ ව්‍යාපෘති 30 ක් ආරම්භ කර තිබු නමුත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර දමා තිබුණි.

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

-------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක එකතුව රු.167,713,656 ක් වූ ව්‍යාපෘති 130 ක ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

## 3.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

-------------------------------------

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ ය අනුව නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ එකතුව රු.384,291 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආරක්ෂක කටයුතු සඳහා පෞද්ලික ආරක්ෂක සේවා සපයන ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම අනුව ප්‍රධාන ආරක්ෂක නිලධාරි ඇතුළු නිලධාරින් 08 දෙනෙකු සේවයේ යෙදවීමටත් ඒ සඳහා මාසයකට රු.149,600 ක ගාස්තුවක් ගෙවීමටත් එකඟ වි තිබුණි. පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා එම ආරක්ෂක සේවා සපයන ආයතනය අතර වෙනම ගිවිසුමක් යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේද ආරක්ෂක සේවා සැපයීමට එකඟ වී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආරක්ෂක සේවා සපයන ආරක්ෂක නිලධාරින් අතරින් එක් නිලධාරියෙකු පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ආරක්ෂක සේවා කටයුතුවලට අනුයුක්ත කර තිබුණු අතර ඒ වෙනුවෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කර තිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව සිදු කළ අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) දොළුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 6 කදී අවම සාමාජික සංඛ්‍යාව සම්පුර්ණ නොකළ ප්‍රසම්පාදන කමිටු මඟින්, එකතුව රු.684,795ක් වූ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන තිබුණි.

(ආ) උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.115,424 ක සැපයුම් හා සේවා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් වෙතින් මිලදී ගෙන තිබුණි.

(ඇ) පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.234,586 ක මිලදී ගැනීම් සිදු කර තිබුණි.

(ඈ) මහනුවර දිස්ත්‍රික්කයේ මිනිපේ, උඩදුම්බර, මැදදුම්බර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කි.මී.48 ක් ආවරණය වන පරිදි, ඉදිකිරීමට යෝජනා කර තිබූ විදුලි වැට සඳහා සීමිත ජාතික ලංසු කැඳවා තිබුණි. ලොට් අංක 1 සඳහා ලංසුකරුවන් දෙදෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර තිබුණි. එක් ලංසුකරුවෙකු විසින් කොන්දේසි උල්ලංඝනය කර තිබුණු බව ප්‍රසම්පාදන කමිටුව තීරණය කර එම ලංසුව ඇගයීමකට ලක් කර නොතිබුණි. අනෙක් ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශයේ සඳහන් අරමුණු ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. ප්‍රසම්පාදනය සඳහා තරඟකාරිත්වයක් නොමැතිවීම නිසා ඇස්තමේන්තුව හා ලංසුව අතර විචලනය සියයට 27 ක් වීම හේතුවෙන් කාර්යාලයේ ඇස්තමේන්තුව රු.99,547 කින් ඉක්මවා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැය කර තිබුණි.

(ඉ) ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථයකට වාමුවාවක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණු අතර එම ලංසු ප්‍රතික්ෂේප කර මෝටර් රථ පරික්ෂකගේ නිර්දේශය මත වෙනත් ආයතනයකින් අළුත්වැඩියාව සිදු කර ගෙන තිබුණි. මෙනිසා කැඳවා තිබුණු ලංසුවල සඳහන් සවිකිරීමේ ගාස්තුව රු.28,277 කින් ඉක්මවා වාමුවාව සවි කරවා ගෙන තිබුණි.

## 3.9 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දුනුවිල මහකැලේ මාර්ගයේ පාලම අසළ සිට සංවර්ධනය කිරිම වෙනුවෙන් අවසන් කළ වැඩ වටිනාකම සඳහා කොන්ත්‍රාත්කරු විසින් රු.470,110 ක වියදම් වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. කාර්මික නිලධාරියා විසින් ඒ සඳහා රු.494,426 ක් ගෙවීම නිර්දේශ කර තිබුණි. තවද ගිවිසුම් කාලය 2014 ජුලි 23 දිනෙන් අවසන් වුවද, 2014 අගෝස්තු 14 දින දක්වා කාලයට අදාලව වියදම් වාර්තාව සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගත් රු.381,710 ක් වටිනා බිල්පත් පමණක් ඉදිරිපත් කර තිබුණි.

## 3.10 පාඩු හා හානි

2014 මැයි 30 දින හා 2014 ජුනි 02 දින අතර දිනක ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ්රථයක් අනතුරට පත්වීමෙන් කැබ් රථයේ ඉදිරිපස වාමුවාව බිඳී තිබුණු අතර එය රු.156,959 ක් වැයකර යථා තත්ත්වයට පත් කර තිබුණි. මේ වෙනුවෙන් රක්ෂණ සමාගමෙන් රු.74,000 ක් ප්‍රතිපූර්ණය කිරිමෙන් පසු සමාලෝචිත වර්ෂයේ රු.82,959ක අලාභයක් සිදුවී තිබුණි.

**3.11 විසඳා නොතිබුණු විගණන ඡේද**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2012 | 4.9 (ආ) | අනුමැතියකින් තොරව කාර්යාලයේ වාහනයක් පෞද්ගලික ගමනක යෙදී සිටියදී, අනතුරකට පත්වීමෙන් වූ අලාභහානිය සම්බන්ධයෙන් වගකිව යුත්තන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි. |
| 2010 | 4.9(ඇ) | -එම- |

**3.12 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙර පාසැල් ළමුන් සඳහා කිරි වීදුරුවක් සැපයීමේ ව්‍යාපෘතිය, පෙර පාසැල් 34 කින් 29 ක ක්‍රියාත්මක කර නොතිබුණි. මේ නිසා වර්ෂ අවසානයේ සළසා තිබුණු ප්‍රතිපාදන වලින් රු.392,595 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ සියයට 15 ක් වැනි සුළු ප්‍රමාණයක් ලබා ගෙන තිබුණි.

(ආ) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනක විදුලි වැට තැනීමේ කොන්ත්‍රාත්තුව පුද්ගලික සමාගමකට මාසයක කාලයකින් නිම කිරීමේ කොන්දේසිය මත 2014 සැප්තැම්බර් 22 දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම් කාලය 2015 පෙබරවාරි 06 දිනැති ලිපිය මඟින් 2015 පෙබරවාරි 16 දින තෙක් දීර්ඝ කර තිබුණ නමුත්, විගණන පරීක්ෂණ දිනය වූ 2015 ජුනි 01 දින වන විටත් එම ඉදිකිරීම නිමකර නොතිබුණි. ඒ අනුව ගිවිසුම ප්‍රකාරව දිනකට රු.1,431 බැගින් දින 104 ක් සඳහා අයකළ යුතු රු.148,824 ක ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

කාර්යසාධන බැඳුම්කරයන්හි වලංගු කාලය ඉක්මවීමට ප්‍රථමයෙන් අලාභය අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 70 | 65 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 51 | 34 | 17 |
| (iii) | ද්විතියික මට්ටම | 3,431 | 3,158 | 273 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 251 | 203 | 48 |
| | **එකතුව** | **3,803** | **3,460** | **343** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 343 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.